# *උපාධි අපේක්ෂක ශිෂ්‍යයින්ට පුස්තකාල සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල පුස්තකාල තුළ ක්‍රියාත්මක වන පාඨක අධ්‍යාපන ක්‍රමවේද සතු භූමිකාව*

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***එච්. එම්.ඒ. යූ. හේරත්[1]***

සංක්ෂේපය

පුස්තකාල සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල පුස්තකාල තුළ ක්‍රියාත්මක වන පාඨක අධ්‍යාපන ක්‍රම වේද සතු භූමිකාව යන මාතෘකාව ඔස්සේ මෙම අධ්‍යයනය සිදු කර ඇත. පුස්තකාල හෝ ප්‍රලේඛන මධ්‍යස්ථාන වල ඇති විවිධ තොරතුරු මූලාශ්‍ර පිළිබඳවත් ඒවා භාවිතා කරන ආකාරය පිළිබඳවත් පාඨකයාව දැනුවත් කිරීම සඳහා අනුගමනය කරන වැඩසටහන් සරලව පාඨක අධ්‍යාපන වැඩසටහන් ලෙස හඳුන්වා දිය හැකිය. ඒ අනුව විශ්වවිද්‍යාල පුස්තකාල තුළ පාඨකයාට උපරිම සේවාවක් ලබා දීම සඳහා අනුගමනය කරන පාඨක අධ්‍යාපන වැඩසටහන් මොනවා ද සහ ඒවා නිසි අයුරින් ක්‍රියාත්මක වන්නේ ද යන්න පිළිබදව අධ්‍යයනය කිරීමට කැලණිය, කොළඹ, හා වයඹ යන ප්‍රධාන විශ්වවිද්‍යාල වලින් සියලුම වසර නියෝජනය වන පරිදි පුස්තකාල පාඨකයින් 90ක් හා පුස්තකාල තුනෙයි පුස්තකාලයාධිපතිවරු තුන්දෙනා ඇසුරින් මෙම අධ්‍යයනය සිදු කර ඇත. මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථය නම් විශ්වවිද්‍යාල පාඨක ප්‍රජාවට තම අධ්‍යයන කටයුතු සාර්ථක ලෙස සිදු කර ගැනීම සඳහා විශ්වවිද්‍යාල පුස්තකාල පරිහරණය කිරීමේදී එම පුස්තකාල සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල පුස්තකාල තුළ ක්‍රියාත්මක වන පාඨක අධ්‍යාපන ක්‍රමවේද සතු භූමිකාව අධ්‍යයනයට ලක් කිරීමයි. මෙම ප්‍රධාන අරමුණු හැරණ විට මෙම අධ්‍යයනයේ සෙසු අරමුණු ද පවතී. විශ්වවිද්‍යාල පුස්තකාල සම්පත් වලින් උපරිම ඵල ලබා ගැනීමට යාමේදී පාඨක අධ්‍යාපන ක්‍රම වේද සතු දුර්වලතා හඳුනා ගැනීම, එම දුර්වලතා සඳහා නව යෝජනා ඉදිරිපත් කිරීම, පාඨක අධ්‍යාපන වැඩසටහන් හඳුන්වා දීමෙන් පසු විමර්ශන අංශය පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීම. පාඨක අධ්‍යාපන වැඩසටහන් හඳුන්වා දීමෙන් පසු බැහැරදෙන අංශය පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීම, පාඨක අධ්‍යාපන වැඩසටහන් හඳුන්වා දීමෙන් පසු තොරතුරු සේවා අංශය පිළිබඳ අවබෝධය පරීක්ෂා කිරීම, යනාදී කරුණු මෙම අධ්‍යයනයට උප අරමුණු වී ඇත. මෙම අධ්‍යයනයෙන් නිගමනය කළ හැකි වුයේ අධ්‍යයනය සඳහා තෝරා ගත් කිසිඳු විශ්වවිද්‍යාල පුස්තකාලයක් තුළ පුස්තකාල පාඨක අධ්‍යාපන වැඩසටහන් විධිමත් ලෙස ක්‍රියාත්මක නොවන බවයි. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ප්‍රධාන වශයෙන්ම නොහැකි වී ඇත්තේ විශ්වවිද්‍යාල පුස්තකාල තුළ සහයෝගීතාවයක් නොමැති බව අධ්‍යයනය තුළින් පැහැදිලි වේ. මේ සඳහා තවත් ප්‍රධාන හේතුවක් ලෙස අධ්‍යයනය තුළින් නිගමනය කළ හැකි වන්නේ විද්‍යුත් මාධ්‍ය තුළින් පුස්තකාල හඳුන්වා දීමේ වැඩසටහන් නොපවත්වන බවයි. අධ්‍යයනය සඳහා තෝරා ගත් සෑම විශ්වවිද්‍යාල පුස්තකාලයක් තුළම ප්‍රමාණවත් කාලයක් වෙන් කර ගනිමින් පුස්තකාල පාඨක අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක නොකරන බව අධ්‍යයනය තුළින් නිගමනය කළ හැකිය. මේ ආදී වු නිගමනයන්ට මෙකී අධ්‍යයනය තුළින් එළඹිය හැකිය. විශ්වවිද්‍යාල පුස්තකාල සම්පත් වලින් උපරිම සේවාවක් ලබා ගැනීමට විශ්වවිද්‍යාල පුස්තකාල පාඨකයින්ට පමණක් නොව පොදුවේ සියලුම පුස්තකාල භාවිත කරන පාඨකයින්ට මෙම අධ්‍යයනය මගින් පුළුල් අවබෝධයක් ලබා ගැනීමට හැකි වනු ඇත.

**ප්‍රමුඛ පද:** පාඨක අධ්‍යාපනය, විශ්වවිද්‍යාල පුස්තකාල, පුස්තකාල සම්පත්, පුස්තකාල පාඨකයින්, පාඨක අධ්‍යාපන ක්‍රමවේද සතු භූමිකාව

*1. පුස්තකාල හා විඥාපන විද්‍යාව, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2 මහාචාර්ය, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*